සන්නස SANNASA

# ලියා දන්වන වග

## කටුක මගක එක මොහොතක

සන්නස ආරම්භ කළ දා සිට නව මගක් ගත් සාර සංග්‍රහයක් ලෙස පවත්වාගෙන යන්නට අපි උත්සාහ කළෙමු. එය පහසු ගමනක් නොවී ය. අපි ඒ අපහසු ගමනේ වසර 13 ක් අවසන් කළ තැන දැන් නව ජවයකින් අලුත් ඇරඹුමකට පිවිස සිටින්නෙමු. සන්නස මැයි කලාපයේ නව මුහුණුවර සන්නස සමග බැඳී සිටින බොහෝ දෙනෙකුගේ සතුටට හේතු වූ බව ඔවුන්ගේ ප්‍රතිචාර වලින් අපට පෙනෙයි. එය අපටද සතුටකි. නව සන්නසේ හොඳත් නරකත් සුහද සිතින් පෙන්වාදුන් අපේ පාඨකයනට හිස නමා ආචාර කරමු. අපට අවශ්‍ය වන්නේ සන්නස සමගින් බොහෝ කාලයක් ඔබ සමග එක්ව සිටින්නට ය.

සන්නස ට සුවිශේෂී අනන්‍යතාවක් ඇත. අපේ පාඨකයන් අප සමග රැඳී සිටින්නේ ඒ අනන්‍යතාව නිසා ය. වට පාරෙන් නොගොස් කෙළින් කතා කරන පත්තරයක් හැටියට අප රැකගත් නම ඉදිරියටත් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන්නෙමු. බොහෝ බාධක මැද මේ සා දුරක් ආ පසු අපට නැවත හැරීමක් නැත. අපි සෙමින් නමුත් ඉදිරියටම යමින් සිටින්නෙමු.

අපට මහන්සියේ කටුක සීතල දැනෙනේම නැත. අප සමග නිබඳ රැඳී සිටින ඔබේ සුහදතාවේ උණුසුම අපට දැනෙන නිසා ය.

**අපි ඉදිරියටම යමු.**
සංස්කාරකවරු

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe
editor@sannasa.com.au
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සහය සංස්කරණය / Asst Editor**
අසෝක සිල්වා Asoka Silva

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by Crystal D** | Digital Agency
www.crystald.com.au

**මෙම කළාපයේ කවර නිර්මාණය**
හර්ෂ කසුන් Harsha Kasun

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:** Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.



# ව්‍යාජ වියතුන් වෙනුවට සැබෑ වියතුන් අවශ්‍ය ය

## විපුල කරුණාතිලක

**පසුගිය සතියේ ජනමාධ්‍යයේ ප්‍රධාන අවධානය යොමුවී තිබුණේ ගෝඨාභය රාජපක්ෂ මහතා තමන්ගේ වියත්මග සංවිධානයේ දෙවර්ෂ පූර්ණයට කළ දේශනයයි. මේ සංවිධානයේ සිටින සියලුදෙනාම පාහේ (පෙනෙන නොපෙනෙන) පසුගිය ආණ්ඩුවේ තනතුරු දැරූ හෝ වක්‍රව එම ආණ්ඩුවෙන් වරප්‍රසාද ලැබූවෝ වෙති. මේ පිරිසට මෙලෙස සංවිධානය වීමට අවකාශය ලැබුණේ පවතින ආණ්ඩුවේ ඇති දූෂණ, ඇමතිවරුන්ගේ ඥාති සංග්‍රහ හා අකාර්යක්ෂමතාව නිසාය. මොවුන්ගේ වියත් වෙස් මුහුණට යටින් ඇත්තේ දේශපාලන ව්‍යාපෘතියකි. එනම් පවතින ආණ්ඩුවේ අසමත්කම්, දූෂණ හා වංචා වෙනුවට ඊට එහා ගිය ශක්තිමත් බවක් තමන් සතු බවට මතවාදයක් සමාජයට ගෙනයෑමයි. වියත්මග විසින් උත්කර්ෂයට නංවන 2010-2014 වර්ෂ 04 හා ගෝඨාභය රාජපක්ෂ මහතා තම දේශනයෙන් අවධාරණය කරන ලද කළයුතු අධ්‍යාපන, ආර්ථික, පුද්ගල අභිමානය හා දූෂණ විරෝධයේ යථාර්ථය විමසීම මේ ලිපියේ අරමුණයි.**

2010-2014 යනු නගර අලංකරණය හා වාණිජ පොලී අනුපාතයට දේශීය විදේශීය ණය මත පදනම් ඉදිකිරීම් හා ඒ හා බැඳුණු තාවකාලික රැකියා හැරෙන්නට රටේ ආර්ථික වෘද්ධිය හා තිරසාර රැකියා අවස්ථා වැඩි කිරීමක් සිදුවී නැත. අධ්‍යාපනයේ විප්ලවීය වෙනස්කම් කිරීමට තිබුණේ බලය තිබූ කාලයේය. ඕනෑම රටක ප්‍රධාන වශයෙන්ම අධ්‍යාපනයේ බර තමන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය කෙරෙහිය. අධ්‍යාපනඥයන් හා මනෝවිද්‍යාඥයන්ට අනුව දරුවන්ගේ ගණිත හා භාෂා හැකියාව වර්ධනයවන්නේ පළමු වසර 08 තුළය. මේ සඳහා විධිමත් ප්‍රාථමික අධ්‍යාපනයක් ලබාදිය යුතුය. අවාසනාවකට ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය අසමතුලිතය. ප්‍රාථමික අධ්‍යාපනය තීරණය වන ප්‍රධාන සාධක වන මාපියන්ගේ දැනුම මට්ටම හා ආර්ථික හැකියාව අතර ඇත්තේ දැඩි අසමානතාවකි. මේ අසමානතාව සමතුලිත කිරීම සඳහා සමාන අධ්‍යාපන අයිතීන් වෙනුවෙන් කටයුතු කරන රටවල් පිළියම් යොදයි. ඒ සඳහා දරුවන්ට අවුරුදු 04 සිට දිනකට පැය 06කට ආසන්න කාලයක් පාසල් අධ්‍යාපනය ලබාදෙයි. පළමු අවුරුදු දෙක තුළ උගන්වන්නේ සමාජීය ජීවිතයක් ගතකරන්නේ කෙසේද යන්නයි. ලංකාවේ පසුගිය අවුරුදු 20 තුළ වර්ධනය වී ඇත්තේ සමාජීය ජීවිතය හඳුනන පිරිසක් නොවේ. අවම වශයෙන් අනෙකාට ගරු කරමින් පාරේ වාහනයක් එලවීමට දන්නේද සුළු පිරිසකි. අනෙක් කරුණ වන්නේ පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වයයි. සමස්ත පාසල් දරුවන්ගෙන් 25%කට අවශ්‍ය ශරීර ස්කන්ධ දර්ශකය නොමැත. අනෙක් කරුණ වන්නේ අපොස සා. පෙළ විභාගය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයන්ගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් ගණිතය හා ඉංග්‍රීසි අසමත්වීමය. තවද ලංකාවේ පාසල් පද්ධතියේ ඇත්තේ විශාල අසමතුලිතතාවකි. විද්‍යා විෂයයන් සහිත පාසල් 50%ක් පිහිටා ඇත්තේ බස්නාහිර පළාත ඇතුළතය. රට තුළ සමාන අධ්‍යාපන අවස්ථා ඇති නොකර ගෝඨාභය මහතා බලාපොරොත්තු වන අධ්‍යාපනයේ වෙනස්කම් කළ නොහැකිය. නගර අලංකරණය වෙනුවට විධිමත් ප්‍රාථමික පාසල් පද්ධතියක් ඇති කළේ නම් එය දිගුකාලීනව රටට වැඩදායකය. ජපානය වැනි රටක් දියුණුවීමට බලපෑ ප්‍රධාන සාධකය වූයේ අධ්‍යාපනයයි. 1867 මෙයිජි පුනස්ථාපනයේ ප්‍රධාන අරමුණ වූයේ රටේ සියලුම දරුවන්ට සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස වසර 30ක් ගතවන විට ජපානය ලෝකයේ ඕනෑම රටක් හා තරග කළ හැකි කාර්මික නිෂ්පාදන හැකියාවන් අත්කර ගත්තේය. රථවාහන නිෂ්පාදනයේ ප්‍රමුඛයන් වන ටොයොටා මිට්සුබිෂි සමාගම් ආරම්භවන්නේ 19 වන සියවස අගභාගයේදීය. 1867 සිට 1900 පමණ වන විට ජපානයේ දළ දේශීය නිෂ්පාදිතය 20% සිට 30% වැයකර තිබුණේ අධ්‍යාපනය වෙනුවෙනි. එහෙත් කනගාටුවට කරුණ වන්නේ ලංකාවේ අධ්‍යාපනය සඳහා කරන ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අඩුවී ඇත්තේ 20102014 කාලයේය. 1995 3%ක් වූ එය 2014 වනවිට 17% දක්වා අඩුවී ඇත.

අනෙක් කරුණ වන්නේ ගෝඨාභය මහතා ඉදිකළ ආසියාව හා බැඳුණු ආර්ථික ක්‍රියාවලියයි. 1977 සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන්ම නිෂ්පාදන අපනයනය කරනුයේ ඇමෙරිකාවට හා යුරෝපයටය. ලංකාවේ නිමි භාණ්ඩවල ප්‍රධාන ගැනුම්කරුවන්නේ ඇමෙරිකාව හා එංගලන්තයයි. 1990 සිට 2005 දක්වාම බහුතන්තු යෝජනා ක්‍රමය යටතේ ලැබුණු ඇණවුම් මත නිෂ්පාදනය කළ භාණ්ඩ යුරෝපය හා ඇමරිකාවට අපනයනය කර තිබුණි. තරගකාරී වෙළෙඳපොළ තුළ තරග කොට නිෂ්පාදන අපනයනය කිරීමට නොහැකි නිසා ජීඑස්පී සහනය තීරුබදු සහන මගින් වැඩි අප නයන අවකාශයක් ලබාගැනීමට හැකිවිය. ගෝඨාභය මහතා යෝජනා කළ චීනය හා ලංකාව අතර වෙළෙඳාම සැලකූ විට සිදුවී ඇත්තේ යුරෝපයේ උපයන ඩොලර්